මගේ අංකය: JSC/SEC/CIR/2022

සියලුම මහාධිකරණ විනිසුරුවරුන් හා මහේස්ත්‍රාත්වරුන් වෙත,

**මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු මධ්‍යස්ථාන යොදා ගැනීම.**

ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, ටී. අයි. උඩුවර මහතා සහ බන්ධනාගාර කළමණාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (විශේෂ ව්‍යාපෘති) එච්. එම්.එන්. සී. ධනසිංහ මහතා විසින් පිළිවෙලින් 2021.11.16 හා 2021.12.08 දිනැතිව යොමුකර ඇති ලිපි ඔබගේ අවධානයට ලක්කරන ලෙසට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් 2021.12.31 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපි ඔබගේ අවධානයට ලක්කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව ඔබගේ අවධානය සඳහා 2021.11.16, 2021.12.08 හා 2021.12.31 දිනැති ලිපි වල පිටපත් මේ සමඟ අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 පෙබරවාරි මස 07 වන දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිශන් සභා ලේකම් කාර්යාලයේදීය

බන්ධනාගාර මූලස්ථානය
சிறைச்சாலைத் தலைமையகம்
PRISON HEADQUARTERS
150, බේස්ලයින් පාර, කොළඹ 09. 150, பேஸ்லைன் வீதி,கொழும்பு 09. 150, Baseline Road, Colombo-09.

| දුරකථන<br>தொலைபேசி<br>Telephones | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 2695204<br>4677177 | කොමසාරිස් ජනරාල්<br>ஆணையாளர் நாயகம்<br>Commissioner - General | 2691976 | කොමසාරිස්<br>ஆணையாளர்<br>Commissioner | 2695221<br>2692818 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 2695206<br>4677180 |
|---|---|---|---|---|---|---|---|---|

මගේ අංකය / எனது இல. / My No. කේ 08/මත්ද්‍රව්‍ය/විවිධ/2021, ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021-11-16

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

ලේකම් මගින්,
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශය.

<u>මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු මධ්‍යස්ථාන යොදා ගැනීම</u>

උක්ත කාරණය සම්බන්ධයෙන් අධිකරණ මගින් බන්ධනාගාර ගත කරනු ලබන මත්ද්‍රව්‍ය ඇබ්බැහිවූවන් පුනරුත්ථාපන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා දායක වන ආයතන වෙත පහත පරිදි මාරු කිරීම කටයුතු කරන ලෙසට සියළුම බන්ධනාගාර අධිකාරිවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

මෙම මාරු කරනු ලබන රැඳවියන් අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි සිර දඬුවම් නියමවූවන් වේ.

| අනු අංකය | වයස අනුව වර්ගීකරණය | බන්ධනාගාර ගත වූ වාර ගණන | මාරු කරනු ලබන ආයතනය |
|---|---|---|---|
| 01 | අවු 22 අඩු තරුණ රැඳවියන් | - | අඹේපුස්ස පබෝධා මෙත් සෙවණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය |
| 02 | අවු 22 – 30 අතර රැඳවියන් | පළමු වතාව හා දෙවන වතාව | වීරවිල, තල්දෙන, සහ පල්ලන්සේන කඳවුරු |
| 03 | ඉහත ගණයට අයත් නොවන සියළුම රැඳවියන් | - | පල්ලෙකැලේ, අනුරාධපුර, කන්දෙවත්ත |
| 04 | සියළුම කාන්තා රැඳවියන් | - | දුම්බර කාන්තා අංශය |
| 05 | කඳවුරු තුලට ඇතුලත් කල නොහැකි අනෙකුත් රැඳවියන් | - | මහර බන්ධනාගාරය |

ඒ අනුව අධිකරණ මගින් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා රැඳවියන් යොමු කිරීමට අදාලව නියෝග නිකුත් කිරීමේදී ඉහත සඳහන් පරිදි කටයුතු කිරීම මගින් ඇතිවිය හැකි ගැටළු අවම කර ගැනීමට හැකි වන බැවින් මේ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව හරහා සියළුම මහේස්ත්‍රාත්තුමන්ලා දැනුවත් කිරීමට කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ටී. අයි. උඩුවර,
බන්ධනාගාර කොමසාරිස් ( මෙහෙයුම්)
අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

දුරකථන
தொலைபேசி
Telephone } 2883719
ෆැක්ස්
தொலைநகல்
Fax } 2883690

ලේකම්
செயலாளர்
Secretary
දුරකථන
தொலைபேசி
Telephone } 2883725
ෆැක්ස්
தொலைநகல்
Fax } 2883726

BY HAND

ප්‍රධාන කාර්යාලය
பிரதான காரியாலயம்
General Office } 2883926 2883927 2883928
ෆැක්ස්
தொலைநகல்
Fax } 2883929

බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
சிறைச்சாலைகள் முகாமைத்துவம் மற்றும் சிறைக்கைதிகள் புனர்வாழ்வு நடவடிக்கைகள் இராஜாங்க அமைச்சு
State Ministry of Prison Management and Prisoners Rehabilitation Affairs

විද්‍යුත් තැපැල්
மின்னஞ்சல்
E-mail } info@mmcdol.gov.lk
40, බුත්ගමුව පාර,රාජගිරිය.
40, புத்கமுவ வீதி, இராஜகிரிய.
40,Buthgamuwa Road, Rajagiriya.

මගේ අංකය
எனது இல.
My No. } SMPRPR/PRI/06/මත්.ඇබ්. පුනරුත්ථාපනය

ඔබේ අංකය
உமது இல.
Your No }

දිනය
திகதி
Date } 2021.12. 08

අධිකරණ අමාත්‍යාංශය
කොළඹ 12
10 DEC 2021
තැපැල් අංශය

27 DEC 2021

ලේකම්
අධිකරණ අමාත්‍යාංශය
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12.

<u>මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු මධ්‍යස්ථාන යොදා ගැනීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක. කේ 08/මත්ද්‍රව්‍ය/විවිධ/2021 හා 2021.11.16 දිනැති ලිපිය හා බැඳේ.(එම ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත)

02.ඒ අනුව අධිකරණ මගින් බන්ධනාගාර ගත කරනු ලබන මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා දායක වන ආයතන වෙත මාරු කිරීමට කටයුතු කරන ලෙස සියලුම බන්ධනාගාර අධිකාරීවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලද බවත්, ඒ අනුව අධිකරණ මගින් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා රැඳවියන් යොමු කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමුකරන ලෙස අධිකරණ සේවා කොමිසම හරහා සියළුම මහෙස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීමට කටයුතු සලසා දෙන මෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් එවා ඇති ලිපිය අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව යොමු කරමි.

එච්.එම්.එන්.සී.ධනසිංහ
අතිරේක ලේකම් (විශේෂ ව්‍යාපෘති)
රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

ලේකම්
செயலாளர்
Secretary
දුරකථනය
தொலைபேசி
Telephone 2449959
ෆැක්ස් අංකය
பெக்ஸ் இல.
Fax No. 2445447

E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය
பொது அலுவலகம்
General Office
දුරකථනය
தொலைபேசி
Telephone 2323022
ෆැක්ස් අංකය
பெக்ஸ் இல.
Fax No. 2320785

Web Site: www.moj.gov.lk

# අධිකරණ අමාත්‍යාංශය
# நீதி அமைச்சு
# MINISTRY OF JUSTICE

ANNEXE A
ඊ-මේල්
Tele
ரெலிமெயில் Secmojust
තැ.පෙ.
தபால்பெட்டி
P.O. Box. 555

ඉලෙක්ට්‍රෝනික තැපැල
மின்அஞ்சல்
E-mail info@moj.gov.lk

උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12
மீயுயர் நீதிமன்ற கட்டிடத்தொகுதி
கொழும்பு 12
Superior Courts Complex,
Colombo 12.

මගේ අංකය
எனது இல
My No. MOJ/L13/JSC/2020

ඔබේ අංකය
உமது. இல.
Your No. SMPRPR/PRI/06/මත්.ඇබ්.පුනරුත්ථාපනය

දිනය
திகதி
Date 2021/12/31

B/H
04 JAN 2022

එච්.එස්.සෝමරත්න මයා
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

<u>මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු මධ්‍යස්ථාන යොදා ගැනීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් විසින් බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මඟින් අප වෙත යොමුකරන ලද 2021/12/08 දිනැති හා යොමු අංක SMPRPR/PRI/06/මත්.ඇබ්.පුනරුත්තාපනය දරණ ආවරණ ලිපිය සහ එහි ඇමුණුම යටතේ, අධිකරණ මඟින් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා රැඳවියන් යොමු කිරීමට අදාලව අධිකරණ නියෝග නිකුත් කිරීම සම්බන්ධයෙන් ගරු මහේස්ත්‍රාත්තුමන්ලා දැනුවත් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. (එකී ආවරණ ලිපිය හා එකී ඇමුණුමේ පිටපතක් ඔබගේ අවධානය සඳහා මේ සමඟ අමුණා ඇත.)

ඒ අනුව, එම ඉල්ලීමේ දක්වා ඇති කරුණු අනුව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමට අදාලව නියෝග නිකුත් කිරීමේදී සලකා බැලීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව සියලුම මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන්නේ නම් මැනවි.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය